# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

2019 සැප්තැම්බර් මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය විය. ඒ අනුව, ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2019 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.9 කින් පහළ යමින් 2019 සැප්තැම්බර් මාසයේ දර්ශක අගය 54.7 ක් ලෙස වාර්තා කරන ලදී. සැප්තැම්බර් මාසය තුළදී නිෂ්පාදන සහ නව ඇණවුම් වල සිදුවූ මන්දගාමීත්වය, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අඩු වේගයකින් වර්ධනය වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදනයේ සිදුවූ මන්දගාමීත්වය විශේෂයෙන්ම, ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි ක්‍රියාකාරකම් මගින් දැක ගත හැක. නව ඇණවුම් සහ නිෂ්පාදන අඩු වේගයකින් වර්ධනය වුවද, අනාගතයේ ඇතිවිය හැකි ඉල්ලුම සපුරාලීම සඳහා විශේෂයෙන්ම, ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ ගැනුම් තොග සැළකිය යුතු ලෙස ඉහළ යන ලදී.

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.6** | **54.7** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 61.0 | 58.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 60.5 | 52.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 50.5 | 55.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 55.0 | 56.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.5 | 50.0 | - | ඉහළ යෑමක සිට නොවෙනස් මට්ටමට ලඟා වීමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සිදු කරන ලද බඳවාගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය ඉහළ යන ලදී. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතුණි.


සලකනු ලැබූ කාල සීමාවේදී නොවෙනස් මට්ටමේ පැවති, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය හැර ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.7**

**2019 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.9 ක පහළ යාමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.2 කින් පහළ යමින් 2019 සැප්තැම්බර් මාසයේදී 49.7 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 සැප්තැම්බර් මාසයේදී, යුරෝපා කලාපය, සිංගප්පූරුව සහ රුසියාව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවත් එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ චීනය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කළ අතර ඉන්දියාව නොවෙනස්ව පැවතුණි.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 ඔක්තෝබර් 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙලේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

2019 සැප්තැම්බර් මාසයේ දී සේවා අංශය අඛණ්ඩව වර්ධනය වූ අතර, එය 2019 අගෝස්තු මාසයට සාපේක්ෂව පහළ වර්ධනයකි. ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ මන්දගාමී වර්ධනය ඊට ප්‍රධාන වශයෙන් හේතු විය.

ව්‍යාපාර ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වුවද, අනාගතයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයට සුභවාදිව දායක විය හැකි පරිදි නව ව්‍යාපාර 2019 සැප්තැම්බර් මාසයේ දී වැඩි වේගයකින් වර්ධනය විය. නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා; මූල්‍ය සේවා; සහ ප්‍රවාහන යන උප අංශ නව ව්‍යාපාරවල සිදු වූ වර්ධනයට දායක විය. මේ අතර, 2019 සැප්තැම්බර් මාසයේ දී අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් අගෝස්තු මාසයේ පැවති මට්ටමෙහිම නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, රටේ වත්මන් දේශපාලන වාතාවරණය හේතුවෙන් ව්‍යාපාර පරිසරයෙහි පවතින අවිනිශ්චිතතාව ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳව පවතින සුභවාදී අපේක්ෂාවලට අහිතකර බලපෑමක් එල්ල කරන බව ඇතැම් ප්‍රතිචාරදක්වන්නන් විසින් සඳහන් කර තිබුණි.

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **52.9** | **52.7** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| **උප දර්ශක** | | | | |
| නව ව්‍යාපාර | 52.7 | 55.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 59.6 | 52.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 43.6 | 47.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.3 | 45.8 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.4 | 63.4 | = | සමාන වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


වසර අග භාගයේ දී බඳවාගැනීම් සිදු නොකිරීම සහ ශ්‍රම බලකායෙහි පවතින නිපුණතා සහ ශ්‍රම ඉල්ලුම අතර ඇති නොගැලපීම් ආදිය හේතුවෙන් පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් ප්‍රමාද වීම, 2019 සැප්තැම්බර් මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව සයවන වරටත් පහළ යෑමට හේතුවිය. ඉල්ලුමෙහි ඇතිවන කවර හෝ ඉහළ යෑමකට සේවා සපයන්නන්හට පවත්නා තත්ත්වය යටතේ මුහුණ දීමට හැකි බව පෙන්නුම් කරමින් නිම කිරීමට ඇති කාර්යයන් උප දර්ශකය, එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා අඩු අගයක් වාර්තා කරන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**52.7**

**2019 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.2 ක පහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 සැප්තැම්බර් මාසයේ දී පසුගිය වසර තුන තුළ වාර්තා වූ පහළම අගය වන 51.6 දක්වා නැවතත් පහළ යන ලදී.

ජපානය, ඇමරිකා එක්සත් ජනපදය සහ චීනය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කළ අතර, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශවල පහළ යෑමක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2019 ඔක්තෝබර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.